| Date | | |
|---|---|---|
| 3. | 4. | 5. |

00000296

21 JUN 2022

27 JUN 2022

## SRI LANKA ARMY VOLUNTEER FORCE HEADQUARTERS

The Registrar,
University of Ruhuna,
Matara.

19 April 2022

**PRESTIGIOUS OPPORTUNITY FOR ENLISTMENT OF THE PROFESSIONAL OFFICERS TO THE SRI LANKA ARMY VOLUNTEER FORCE**

The Professional youth of the country after their tertiary education as a professional degree holders with limited experience are most important to uplift the country with their professional knowledge while helping to safe guard the country and achieving national plan of the future goals. Identifying the above fact and in the view of the employability of the professional youth, the Sri Lanka Army Volunteer Force. invites the young spirits to serve and develop the country as Commissioned Officers.

Sri Lanka Army Volunteer Force was initially formed as the first Ceylon Light Infantry which was originated in 1881 and was comprised with British Nationals and Ceylonese. And, it is proud to mention that the members of the Volunteer Force have greatly contributed in various phases of World Wars. The history of the organization highlights Hon D.S.Senanayake, Sir John Kothalawala and Olympic Medalists MrDunkan White and MsSusanthikaJayasinghe as profound personalities who were sources of inspiration which builds the image of the Volunteer Force. At present, professionals who represent different streams and possess various capacities such as doctors, accountants, lawyers have held hands together with the Volunteer Force. Further prominent figures who being famed in the field of sports such as Mr.DineshChandimal and Mr.ThisaraPerera have joined the organization for serving the country.

Moreover, during the past three decades members of the Volunteer Force actively engaged in the war which had been at its climax. Especially the members of the Volunteer Force, as members of a prestigious organization accomplish their duties in nation building where the country has been submerged in various phenomena. Thus, an era has been dawned for Professionals to pursue a prestigious and honored career in the Volunteer Force.

In the view of above mentioned facts it is greatly expected your contribution for making the persons who have completed their degree with limited experience aware of the enlistment of Professional Officer Cadets in the Volunteer Force. Further, a brochure for the Enlistment of Professional Officer Cadets has been attached here with the letter.

Please reach us on below contacts or visit our website for more information.

| | |
|---|---|
| Web Site | : www.army.lk/slavf/join-us |
| Email | : rohqslavf@gmail.com |
| Contact No | : 0114055123 / 0113188558 |

SAR/AR all faculties

Pls. upload this in LMS & Notice

AR/SA.

C D WEERASURIYA RWP RSP
Major General
Commandant -SLAVF

Commandant : +94(0)362 253150 | Deputy Commandant : +94(0)362 253495 | Principal Staff Officer : +94(0)113 560599
General : +94(0)362 255921 | Fax : +94(0)362 255709 | e mail : hqslavf@army.lk
Army Camp, Salawa, Kosgama, Sri Lanka.

Scanned with CamScanner

SAR / FMST

(2)

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය**

ලේඛකාධිකාරි
රුහුණු විශ්ව විද්‍යාලය
මාතර

2022 අප්‍රේල් මස 19 දින.

<u>ගෞරවණීය සේවයක් උදෙසා අධිකාරිලත් වෘත්තිය නිලධාරීන් / නිලධාරිණියන් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත බඳවා ගැනීම.</u>

ජාතිය ගොඩනැගීමට ඉවහල් වන රටේ සංවර්ධනාත්මක ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් අධිකාරිලත් වෘත්තිය නිලධාරියෙකු ලෙස තම දායකත්වය ලබා දීම සඳහා තෘතීය අධ්‍යාපනයෙන් පසු ඔබ ආයතනය මගින් මූලික උපාධිය සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික යෞවන යෞවනියන් වෙත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව විසින් අනගි අවස්ථාවක් උදා කර දී ඇත.

වර්ෂ 1881 දී ශ්‍රී ලාංකිකයන් හා බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ එකතුවෙන් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද ප්‍රථම පාබල හමුදාව සමගම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව ආරම්භ කරන ලදි. මෙහි සාමාජිකයින් ලෝක සංග්‍රාමයන්හි පවා දායකත්වය සපයා ඇති බවට අභිමානයෙන් යුක්තව සඳහන් කළ හැක. එසේම මහාමාන්‍ය ඩී එස් සේනානායක, සර් ජෝන් කොතලාවල වැනි යුග පුරුෂයන් මෙන්ම ඩන්කන් වයිට්, සුසන්තිකා ජයසිංහ වැනි ඔලිම්පික පදක්කම්ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ද මෙම බලසේනාව තුළින් බිහිවූ සුවිශේෂී පුද්ගලයන් ලෙස හැඳින්විය හැක. වර්තමානයේ පවා මෙම බලසේනාව නියෝජනය කරන නිලධාරීන් විශාල පිරිසක් වෛද්‍ය, ගණකාධිකරණ, නීතිඥ වැනි ක්ෂේත්‍රයන්හි විද්වතුන් මෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායකයින් වන දිනේෂ් චන්දිමාල්, තිසර පෙරේරා වැනි ක්‍රීඩකයින්ද වෘත්තිකයන් ලෙස දේශය වෙනුවෙන් සිය රාජකාරිය ඉටුකරනු ලබයි.

එපමණක් නොව අප රටෙහි පැවති කුරිරු ත්‍රස්තවාදය නිමාකරමින් නිදහස් නිවහල් ශ්‍රී ලංකාවක වෙනුවෙන් ඇප කැප වූ බොහොමයක් ශ්‍රී ලාංකික පුත්‍රයන් පිරිසක් ස්වේච්ඡා බලසේනාව නියෝජනය කළ අතර. වර්තමානයේ පවා ශ්‍රී ලාංකික ජාතියෙහි ආරක්ෂාව වෙනුවෙන් ඕනෑම ව්‍යසනකාරී තත්වයකදී, ස්වභාවික ආපදාවකදී හෝ වසංගත තත්වයකදී ප්‍රමුඛ දායකත්වයක් සපයමින් ආදර්ශමත් ප්‍රතිරූපයකින් යුතුව තම රාජකාරිය වෙනුවෙන් කැප වී කටයුතු කරති. එවන් වූ ගෞරවණීය පුරවැසියෙකු ලෙස සිය යුතුකම ඉටුකිරීමට වෘත්තියවේදියකු ලෙසින ඔබ ආයතනයෙන් බිහිවන උපාධිධාරීන් වෙත මෙය සුවිශේෂී අවස්ථාවක් වනු ඇත.

ඉහත කරුණු සලකා ඔබ ආයතනය වෙතින් උපාධි පාඨමාලා සම්පූර්ණ කළ උපාධිධාරීන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත අධිකාරිලත් වෘත්තිය නිලධාරීන්/නිලධාරිණියන් ලෙස එක්වීමේ උදාර කර්තව්‍යයට දායක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. එසේ අප හා එක්වීමට අපේක්ෂිත සාමාජිකයන් වෙත ඇවැසි සියලු විස්තර ඇතුලත් දැන්වීම් පත්‍රිකාවක් මෙයට ඇමුණුම ලෙස ඉදිරිපත් කරන අතර, ඒ පිලිබඳව ඔබ ආයතනය වෙතින උපාධිය සම්පූර්ණ කල සිසුන්ගේ දැනගැනීමට ලක්කරන මෙන් ඉල්ලා සිටිමි.

වැඩිදුර විස්තර පහත සඳහන් වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ පහත සඳහන් විද්‍යුත් තැපැල් මගින් හා පහත දක්වා ඇති දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි.


වෙබ් අඩවිය - www.army.lk/slavf/join-us
විද්‍යුත් තැපැල් - rohqslavf@gmail.com
දුරකථන අංකය - 0114055123 / 0113188558



සී ඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
මේජර් ජෙනරාල්
සේනාවිධායක ශ්‍රීලංයුහසෙව්බ.




Scanned with CamScanner